# 2022 ශිෂ්‍යත්වය

# පරිසරය කෙටි ප්‍රශ්න 1000

## කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

### 2 ඒකකය

# අපි ලක්වැසියෝ




**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| කාර්ය පත්‍රිකාව | 5 ශ්‍රේණිය | 2. අපි ලක්වැසියෝ |
|---|---|---|

සැකසුම :- ඩබ්.එම්.එස්.එස්.කේ. වීරකෝන්
අ/ දැකැතිපොතාන විද්‍යාලය

ප්‍රාථමික අංශය
කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපය

- **සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.**

1. ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු වර්ෂය වන්නේ,
   1. 1972  2. 1948  3. 1996
2. සියලුම ජනවර්ග එකතු වී සමරන ජාතික උත්සවයකි,
   1. නිදහස් උත්සවය  2. අවුරුදු උත්සවය  3.නත්තල් උත්සවය
3. දන්සල් පවත්වා ජනතාවට සංග්‍රහ කරන උත්සවයකට සම්බන්ධ ජාතිය වන්නේ ,
   1. සිංහල  2. මුස්ලිම්  3. බර්ගර්
4. නිදහස් අධ්‍යාපනයේ පියා වන්නේ,
   1. ඩී.එස්.සේනානායක මහතා  2. අනගාරික ධර්මපාල තුමා
   3. සී.ඩබලිව්.ඩබලිව්.කන්නන්ගර මහතා
5. ජාතික ගීයේ නිර්මාතෘ වන්නේ,
   1. ඕල්කට් තුමා  2. අනගාරික ධර්මපාල තුමා
   3. ආනන්ද සමරකෝන් මහතා
6. තෝසේ,සාම්බාරු ... ආදි ආහාර වර්ග ප්‍රධාන කරගත් ජාතිය වන්නේ,
   1. මුස්ලිම්  2. දමිළ  3. ආදි වාසින්
7. මුස්ලිම් කාන්තාවන්ගේ හිස්වැසුම හඳුන්වන්නේ,
   1. බාපනය  2. සුම්බරේ  3. ඉජාහාප්
8. මාසයක් පුරා පැවැත්වෙන උපවාසය අවසන් කිරීමට පවත්වන උත්සවය වන්නේ,
   1. රාමසාන් උත්සවය  2. දීපවාලි උත්සවය  3. වෙසක් උත්සවය
9. මුස්ලිම් ජාතික කාන්තාවන් අඳින ඇඳුම වන්නේ,
   1. හබාය  2. ජුම්මා  3. ඉජාහාප්
10. ශ්‍රී ලංකාවේ වැඩිම ජන සංඛ්‍යාවක් නියෝජනය කරන ජාතිය වන්නේ,
    1. සිංහල  2. දමිළ  3. මුස්ලිම්
11. ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් කටයුතු කල ජන නායකයෙකි,
    1. අනගාරික ධර්මපාල තුමා  2. ආතර් වී. දියෙස් මහතා  3. ආතර් සී.ක්ලාක්
12. ශ්‍රී ලංකාවේ ලී කැටයම් සඳහා ප්‍රසිද්ධ වන්නේ,
    1. මොරටුව  2. පිළිමතලාව  3. ඇම්බැක්කේ දේවාලය
13. මනස වෙහෙසා කරන ක්‍රීඩාවක් වන්නේ,
    1. ගුඩු පැනීම  2. කැරම් ගැසීම  3. චෙස් ඇදීම
14. බර්ගර් ජාතියෙහි ප්‍රියතම ආහාර වර්ගයකි,
    1. තෝසේ  2. සාම්බාරු  3. කේක්
15. ඉස්ලාම් ආගමික ස්ථානය හඳුන්වන්නේ,
    1. පල්ලිය  2. කෝවිල  3. මස්ජිදය

16. ”භගවත් ගීතාව” නැමති ආගමික ග්‍රන්ථය ප්‍රධාන කොටගත් ජාතිය,

1. සිංහල 2. දමිළ 3. මුස්ලිම්

17. බෞද්ධයන්ගේ අත්පොත ලෙස සැලකෙන්නේ,

1. පන්සිය පනස් ජාතක පොත 2. ත්‍රිපිටකය 3. ධම්මපදය

18. හින්දු භක්තිකයන් ශිව දෙවියන් උදෙසා පවත්වන උත්සවය වන්නේ.

1. තෛපොංගල් 2. මහ සිකුරාදා 3. මහා ශිව රාත්‍රිය

19. ”අහසින් වැටෙනා එක දිය බිඳක් වත් ප්‍රයෝජනයට නොගෙන මහ මුහුදට ගලා යාමට ඉඩ නොදෙන්නැයි”ප්‍රකාශය කළ රජතුමා වන්නේ,

1. මහසෙන් රජතුමා 2. ධාතුසේන රජතුමා 3. පරාක්‍රමබාහු රජතුමා

20. අලුත් සහලින් හිරු දෙවියන් පුදන හින්දු ආගමික උත්සවය වන්නේ,

1. මහා ශිව රාත්‍රිය 2. රාමසාන් උත්සවය 3. තෛපොංගල් උත්සවය




21. ක්‍රිඩාවෙන් ශ්‍රී ලංකාවට කීර්තියක් ගෙන දුන්නේ,

1. පණ්ඩිත් අමරදේව ශූරීන් 2. නීලා වික්‍රමසිංහ 3. සුසන්තිකා ජයසිංහ

22. කුරුළු පාරාදීසය පිහිටා ඇත්තේ,


1. පින්නවල 2. කුමන ප්‍රදේශයේ 3. දෙහිවල

23. ශ්‍රී ලංකාවට විශිෂ්ට සේවාවන් කළ ඉහත සඳහන් පුද්ගලයින්ගේ නම් පිළිවෙළින් ඇති පිළිතුරු වන්නේ,

1.

2.

3.

4.


1. අනගාරික ධර්මපාල තුමා, එස් මහින්ද හිමි, ටී.බී. ජයාමහතා, ආතර් සී ක්ලාක් මහතා
2. ටී.බී.ජයා මහතා, එස්. මහින්ද හිමි, ආතර් සී ක්ලාක් මහතා, අනගාරික ධර්මපාල තුමා,
3. ආතර් සී ක්ලාක් මහතා, එස්. මහින්ද හිමි, අනාගාරික ධර්මපාල තුමා, ටී.බී. ජයා මහතා

24. ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් කටයුතු කළ පින්තූරයේ සඳහන් නායකයා වන්නේ,



1. අනගාරික ධර්මපාල තුමා
2. ටී.බී.ජයා මහතා
3. ආනන්ද කුමාරස්වාමි මහතා

25. ආදි වාසීන් ජීවත් වන ප්‍රදේශයකි,

1. දඹාන 2. වාරියපොළ 3. මින්නේරිය

26. මී පැණි සහ දඩමස් වලට ප්‍රසිද්ධ ජනවර්ගය වන්නේ,

1. සිංහල 2. දමිළ 3. ආදි වාසීන්

27. රූකඩ කලාවට ප්‍රසිද්ධ නගරය වන්නේ,

1. අම්බලන්ගොඩ 2. සීගිරිය 3. පිළිමතලාව

28. ‘‘යුද්දෙටත් ඇවිත් සිදු පිට නැව් නැගීලා”යනු,

1. ජන කවි වලින් උපුටා ගන්නා ලද්දකි.
2. පැරණි හටන් කවි වලින් උපුටා ගන්නා ලද්දකි.
3. ඔන්චිලි වාරමකි.

29. ජාතික කොඩියෙහි ජාතික අභිමානය නිරූපනය කරන්නේ,

1. කහ පැහැති සිංහ රූපයෙනි. 2. රතු පැහැති පසු බිමෙනි.
3. බෝ කොළ හතරෙනි.

30. ශ්‍රී ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක ගණනක් අයත් පළාත වන්නේ,

1. උතුරුමැද පළාත 2. උතුරු පළාත 3. නැගෙනහිර පළාත

31. වෙස් මුහුණු හා ලී බඩු කර්මාන්තය සඳහා අප රටේ ප්‍රසිද්ධ නගර දෙක වන්නේ,

1. දුම්බර, මහනුවර 2. අම්බලන්ගොඩ, මොරටුව
3. දුම්බර, කෑගල්ල

32. ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටි රටක් වන්නේ,

1. ඉන්දියාව 2. කැනඩාව 3. ජපානය

33. අපේ රටේ රාජ්‍ය ලාංඡනයේ දැකිය නොහැකි සංකේතයක් වන්නේ.

1. ධර්ම චක්‍රය 2. ඉර හඳ 3. බෝපත්

34. ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයේ ඇති පුන්කලසෙන් අදහස් කරන්නේ,

1. සෞභාග්‍යයි. 2. ස්වයංපෝෂිත බවයි. 3. සදාකාලික පැවත්ම

35. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යනු,

1. රාජ්‍ය නොවන ආයතනයකි. 2. පෞද්ගලික ආයතනයකි.
3. රාජ්‍ය ආයතනයකි.


36. හින්දු භක්තිකයන් විසින් සමරන උත්සවයක් නොවන්නේ,

1. තෛපොංගල් 2. මහා ශිව රාත්‍රිය 3. රාමසාන්

37. නැගෙනහිර පළාතට අයත් නොවන දිස්ත්‍රික්කයක් වන්නේ.

1. ත්‍රිකුණාමලය 2. මඩකලපුව 3. මුලතිව්

38. මෑතකදී අප අතරින් සමුගත් මහා ගාන්ධර්වයා ලෙස ලක්වාසින් අතර ජනාදරයට පත් පහත රූපයෙහි සඳහන් වන්නේ,



1. ප්‍රේමසිරි කේමදාස මහතා
2. පණ්ඩිත් ඩබ්. ඩී. අමරදේව මහතා
3. මාර්ටින් වික්‍රමසිංහ මහතා

39. ශ්‍රී ලාංකික ජනතාව විසින් නිදහස් දිනය සමරනු ලබන්නේ,

1. මැයි 01 වෙනිදාය. 2. ජූනි 05 වෙනිදාය. 3. පෙබරවාරි 04 වෙනිදාය.

40. අපේ රටේ ජාතික පුෂ්පය හා ජාතික වෘක්ෂය පිළිවෙළින් දැක්වෙන්නේ,

1. මානෙල්, නා 2. නා, මානෙල් 3. රුක්, නා

41. කැරොල් ගීත ගායනා කරන්නේ,

1. හින්දු බැතිමතුන් ය. 2. මුස්ලිම් බැතිමතුන් ය. 3. ක්‍රිස්තියානි බැතිමතුන් ය.

42. සිංහලයන්ගේ ජාතිකාභිමානය ජනිත වන කාව්‍ය නිර්මාණය කළේ,

1. පියදාස සිරිසේන මහතා 2. මාර්ටින් වික්‍රමසිංහ මහතා 3. එස්.මහින්ද හිමි

43. මෙම රූපයේ දැක්වෙන ජාතික වීරයා වන්නේ,



1. මොනරවිල කැප්පටිපොළ
2. අනගාරික ධර්මපාල තුමා
3. ගොංගාලේ ගොඩ බණ්ඩා

44. රත්නදීප ජන්ම භූමි..... ගීතය,

1. දරුනැළවිලි ගීතයකි. 2. බොදු ගුණ ගීතයකි. 3. දේශාභිමානී ගීතයකි.

45. රාජ්‍ය ලාංඡනයේ ඉහලින්ම ඇත්තේ,

1. වී කරල් 2. ඉරහඳ 3. ධර්මචක්‍රය

46. ''අස්ලාම් අලෛකුම්" යන වචනය භාවිතා කර ආචාර කරන ජාතිය වන්නේ,

1. හින්දු 2. මැලේ 3. මුස්ලිම්

47. මෙම රූපයෙන් දැක්වෙන්නේ,



1. ඩී.එස්.සේනානායක මහතා
2. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා
3. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නන්ගර මහතා

48. ගවලෙනක ආකෘතින් සාදන ආගමික උත්සවයකි,

1. දීපවාලි 2. මහාශිව රාත්‍රිය 3. නත්තල්

49. හින්දු ආගමිකයන්ට අයත් ආගමික සැරසිල්ලකි.

1. වෙසක් කූඩු 2. කෝලම් රටා 3. සීල් මුද්‍රන

50. ශ්‍රී ලංකාවේ මුහුදු වෙරළක් පිහිටන පළාතකි,

1. සබරගමු පළාත 2. මධ්‍යම පළාත
3. ඌව පළාත 4. වයඹ පළාත

51. ශ්‍රී ලංකාවට වඩාත් ආසන්නව පිහිටා ඇති රටවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. මාල දිවයින, නේපාලය, භූතානය
2. පාකිස්තානය, ජපානය, බංග්ලාදේශය
3. ඉන්දියාව, පාකිස්ථානය, බ්‍රිතාන්‍ය

52. ශ්‍රී ලංකාවේ සෑම රජයේ පාසල් ශිෂ්‍ය, ශිෂ්‍යාවකටම නොමිලේ රජයෙන් ලබා දෙන්නේ,

1. නිල ඇඳුම්හා දිවා ආහාරය 2. දිවා ආහාරය හා පෙළපොත්ය
3. පෙළපොත් හා නිල ඇඳුම් ය. 4. ශිෂ්‍යාධාර හා දිවා ආහාරය

53. කුරුටු ගී හා බිතු සිතුවම් දක්නට ලැබෙන ඓතිහාසික ස්ථානයකි,

1. සීගිරිය 2. යාපහුව 3. ඉසුරුමුණිය 4. ඇම්බැක්ක

54. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වශයෙන් වලිකුකුළා තෝරා ගැනීමට ප්‍රධාන හේතුව වන්නේ,

1. මෙරට බහුලව සිටීමය 2. මෙරටට ආවේණික වීම ය.
3. සෑම ප්‍රදේශයකම දක්නට ලැබීමය 4. වඩාත් ප්‍රයෝජනවත් වීම ය.

55. අතීතයේ දී අප රට යටත් කරගෙන සිටි විදේශිය ජාතීන් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. පෘතුගීසින්, ලන්දේසීන්, ඉංග්‍රිසීන් 2. ලන්දේසීන්, පෘතුගීසින්, ඉංග්‍රිසීන්
3. ඉංග්‍රිසීන්, පෘතුගීසින්, ලන්දේසීන් 4. පෘතුගීසින්, ඉංග්‍රිසීන්, ලන්දේසීන්

56. කැටයම් කරන ලද සත්ත්ව පේළි ද සහිත විශිෂ්ට කලා නිර්මාණයකි,

1. සෙල්ලිපිය 2. සඳකඩ පහන 3. පුන්කළස 4. පුරාවිද්‍යා ලංඡනය

57. ශ්‍රී ලංකාවේ පිහිටි පූජනීය නොවන ඓතිහාසික ස්ථානයකි,

1. රුවන්වැලිසෑය 2. ගාලු කොටුව 3. ශ්‍රී පාදය 4. ථූපාරාමය

58. ශ්‍රී ලංකාවට නැගෙනහිරින් පිහිටා ඇති රටකි,
1. මැලේසියාව 2. ඉන්දියාව 3. එංගලන්තය 4. ග්‍රීසිය

59. ප්‍රසිද්ධ ලේඛකයකු ලෙස හා තාරකා විද්‍යාඥයකු ලෙස ලෝකයට විශිෂ්ට සේවාවක් සිදු කළ අයෙකි,
1. ශ්‍රීමත් ආතර් සී ක්ලාක් මහතා 2. ශ්‍රීමත් ඩී.බී.ජයතිලක මහතා
3. ආචාර්ය ටී.බී.ජයා මහතා 4. ආචාර්ය ආනන්ද කුමාරස්වාමී

60. ශ්‍රී ලංකාවට ප්‍රථම වරට ඔලිම්පික් පදක්කමක් හිමිකර දුන්නේ කවු ද?
1. සුසන්තිකා ජයසිංහ 2. ඩන්කන් වයිට්
3. ජුලියන් බෝලිං 4. දීපිකා චන්මුගම්

61. මහවැලි ගඟ මුහුදට වැටෙන ස්ථානයට ආසන්නම නගරය කුමක් ද?
1. ත්‍රිකුණාමලය 2. මඩකලපුව 3. මුලතිව් 4. පුත්තලම

62. ලී කැටයම්වලට ප්‍රසිද්ධ ස්ථානයකි,
1. යාපහුව බල කොටුව 2. ලෝවාමහපාය
3. ඇම්බැක්ක දේවාලය 4. ඉසුරුමුණි විහාරය

63. සියළුම ආගමික බැතිමතුන් වැඳ පුදාගන්නා ශ්‍රී පාද ස්ථානය පිහිටි පළාත කුමක් ද?
1. ඌව පළාත 2. නැගෙනහිර පළාත 3. මධ්‍යම පළාත 4.සබරගමුව පළාත

64. ශ්‍රී ලංකික ජනතාව විසින් නිදහස් දිනය සමරනු ලබන්නේ,
1. ජනවාරි 01 වැනිදාය. 2. පෙබරවාරි 04 වැනිදාය
3. අප්‍රේල් 13 වැනිදා ය. 4. මැයි 01 වැනි දා ය.

65. ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ සහ රාජ්‍ය ලාංඡනයේ යන දෙකෙහිම ඇති සංකේතය කුමක් ද?
1. පලාපෙති 2. පුන්කලස 3. බෝපත් 4. කඩුව රැගත් සිංහයා

66. ඔලිම්පික් කොඩියේ ඇති රවුම්වල වර්ණ තුනක් සහිත පිළිතුර තෝරන්න.
1. රතු, නිල්, කහ 2. රතු, කළු, දම්, 3. කළු, කොළ, දුඹුරු 4. නිල්, සුදු, රතු

67. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වන්නේ,
1. කොවුලා 2. ගිරවා ය 3. වලිකුකුළාය 4. පරෙවියා ය

68. ඔලිම්පික් කොඩියේ එකිනෙකට සම්බන්ධ වූ රවුම් ගණන කීය ද?
1. දෙකකි 2. තුනකි 3. හතරකි 4. පහකි

69. කතරගම පූජනීය නගරය අයත් වන්නේ,
1. දකුණු පළාතටය 2. සබරගමු පළාතටය
3. නැගෙනහිර පළාතටය 4. ඌව පළාතටය

70. මින්නේරිය වැව කරවන ලද්දේ ,
1. මහසෙන් රජතුමා 2. ධාතුසේන රජතුමා
3. දේවානම්පියතිස්ස රජතුමා 4. දුටුගැමුණු රජතුමා

71. ''නිදහස් අධ්‍යාපනයේ පියා'' යන විරුදාවලිය ලබන්නේ,
1. ශ්‍රීමත් ඩී.බී. ජයතිලක මහතා
2. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා
3. ආචාර්ය සී ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා
4. ආචාර්ය ටී.බී. ජයා මහතා

72. ඓතිහාසික වටිනාකමින් යුත් පූජනීය නගරයකි,
1. අනුරාධපුරය 2. නුවරඑළිය 3. සීගිරිය 4. වවුනියාව

73. ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටි රටක් වන්නේ,
1. සෞදි අරාබිය 2. ජපානය 3. ඉන්දියාවය 4. කැනඩාව

74. ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපොළ පිහිටා ඇත්තේ,
1. කටුනායක 2. මත්තලය 3. රත්මලානේය 4. වීරවිලය

75. ශ්‍රී ලංකාව් සත්ත්ව පාලනය සහිතව කිරි නිෂ්පාදනය කරන කර්මාන්තශාලාවක් පිහිටි ප්‍රදේශය වන්නේ,
1. වැලිසරය 2. මහ ඉලුප්පල්ලමය 3. හංවැල්ලය 4. අඹේවෙලය

76. දේවානම්පියතිස්ස රජතුමා විසින් තනවන ලද්දේ,
1. තිසා වැව 2. යෝධ වැව 3. කන්තලේ වැව 4. මහකනදරා වැව

77. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනයේ දක්නට ලැබෙන සංකේතයකි,
1. බෝපත් ය 2. හංසයා ය. 3. ඉරය 4. නාගයා ය.

78. ශ්‍රී ලංකාවේ ආරම්භ වූ පළමු අධිවේගි මහා මාර්ගය කුමක් ද?
1. උතුරු අධිවේගී මහා මාර්ගය 2. දක්ෂිණ අධිවේගි මහා මාර්ගය
3. කටුනායක අධිවේගි මහා මාර්ගය 4. කොළඹ-නුවර අධිවේගී මහා මාර්ගය

79. වැරදි ප්‍රකාශය තෝරන්න.
1. ශ්‍රී ලංකාව ඉන්දියාවට දකුණින් පිහිටා ඇත.
2. ශ්‍රී ලංකාව අයත් වන්නේ අප්‍රිකා මහද්වීපයට ය.
3. ශ්‍රී ලංකාව කඳුළක හැඩය ගත් දූපතකි.
4. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටා ඇත.

80. දකුණු පළාතට අයත් නගරයක් වන්නේ,
1. කළුතර 2. බලන්ගොඩ ය. 3. අම්බලන්ගොඩ ය 4. මොනරාගල ය.

81. කොළඹ සිට බදුල්ල දක්වා වැටී ඇති දුම්රිය මාර්ගයේ හමුවන දුම්රිය නැවතුම්පොළකි,
1. වටවල 2. හබරණ 3. සීදුව 4. වව්නියාව

82. ධාතුසේන රජතුමා විසින් කරවන ලද වැවකි,
1. කලාවැව 2. අභය වැව 3. මින්නේරිය වැව 4. ගිරිතලේ වැව

83. ශ්‍රී ලංකාවේ උසම දිය ඇල්ල වන්නේ,
1. බඹර කන්ද ය 2. දියලුම ය 3. ලක්ෂපාන ය 4. දුන්හිඳ ය

84. කොළඹ මෝදර ප්‍රදේශයෙන් මුහුදට වැටෙන්නේ,
1. මහවැලි ගඟය 2. කැලණි ගඟය 3. කළු ගඟය 4. වලවේ ගඟය

85. අභය (බසවක්කුලම) වැව කරවන ලද්දේ,
1. පණ්ඩුකාභය රජතුමා විසිනි 2. දේවානම්පියතිස්ස රජතුමා විසිනි.
3. ධාතුසේන රජතුමා විසිනි 4. මහසෙන් රජතුමා විසිනි.

86. උඩරට ගිවිසුම අත්සන් කළ වර්ෂය වන්නේ,
1. 1948 2. 1815 3. 1505

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප **3in1 Youtube** නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**3 in 1 youtube** නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

**එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ**